# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2117/10 - 2019 අප්‍රේල් මස 02 වැනි අඟහරුවාදා - 2019.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

ජාතික සිනමා දිනය ප්‍රකාශයට පත් කිරීම

1980 අංක 45 දරන පනතින් සංශෝධිත, 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 61. (2). ඕ වන වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලාංකේය සිනමාව දකුණු ඉන්දියානු ආභාසයෙන් මුදවා දේශීය මුහුණුවරක් ගෙන එමින් "රේඛාව" චිත්‍රපටය තුළින් සිනමාවේ හැරවුම් ලක්ෂයක් සනිටුහන් කළ ජ්‍යෙෂ්ඨ සිනමාවේදී ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මැතිතුමාගේ අනුපමේය මෙහෙවර අගයමින් එතුමන්ගේ ජන්ම දිනය යෙදෙන අප්‍රේල් මස 05 වැනි දින **"ජාතික සිනමා දිනය"** ලෙස ප්‍රකාශයට පත් කරමි.

**සජිත් ප්‍රේමදාස,**
නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය.

2019 අප්‍රේල් මස 02 වැනි දින දී ය.

04 - 543